# වසර 6 කට පසු ශ්‍රියන්ත මෙන්ඩිස් මෙල්බන් වේදිකාවේ




*වසර හයකට පසු ඔබ නැවතත් ඔබ උසස් හාස්‍යෝත්පාදක නාට්‍යයක් සමගින් මෙල්බන් වේදිකාවට ගොඩ වන්නට යන බව ආරංචියි. ඒ ගැන අපට විස්තරයක් කියන්න.*

මම ඇතුළු කණ්ඩායම 2003 පාදඩ අසපුව නාට්‍යය සමග මෙල්බන් නගරයටත් සිඩ්නි නගරයටත් බ්‍රිස්බේන් නගරයටත් පැමිණියා. එහිදී අපට විශාල ප්‍රතිචාරයක් ලැබුණා. ඒ ගැන අපි කතා කරන්නේ මහත් සොම්නසින්. ඒ මන්ද කියනවා නම් ශ්‍රී ලංකා වේදිකාවේ සහශ්‍රයේ ප්‍රථම නාට්‍යය හැටියට තමයි පාදඩ අසපුව නිෂ්පාදනය කළේ. මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා එම නාට්‍යය සංවිධානය කළ අපේ හිත මිතුරන්ට.

මම හිතන විදිහට මෙල්බන් නගරයට සම්පූර්ණ නාට්‍ය කණ්ඩායමක් ආව ප්‍රථම අවස්ථාව තමයි පාදඩ අසපුව. නමුත් මම 2008 වසරේත් මෙල්බන් වලට පැමිණියා. ඒ චමප බුද්ධිපාලගේ දස්කොන් නාටයයත් සමගයි. නැවතත් මාර්තු 1 වෙනිදා ඔබ හමුවට මගේ නවතම නිෂ්පාදනය වන රෝමය ගිණී ගනී සමග පැමිණෙනවා. මෙය ද ඔබට නවමු වූ අත්දැකීමක් වෙයි.

*ඔබ මෙම නාට්‍යය සමග ලොව වටා සංචාරයේ යෙදුණා නේද?*

ඔව්. කියන්න සතුටුයි 2008 වර්ෂයේ යුරෝපයේ ද ඇමරිකාවේ ද අපට සාර්ථක සංචාරයක් නිම කිරීමට හැකියාවක් ලැබුණා. මෙහිදී මා දැක්ක විශේෂ කාරණය නම් ශ්‍රී ලංකාවේ වගේම සජීවී මාධ්‍යයක් වන වේදිකා නාට්‍ය නැරඹීමට ප්‍රේක්ෂකයන් විශාල උනන්දුවක් දක්වන බව. මේ සංචාර වලදීත් ප්‍රේක්ෂකාගාර අතුරු සිදුරු නැතුව පිරී ගිය හැටි දැක්කම අපට ඇතිවුණ සතුට කියා නිම කරන්න බැහැ. මොන තරම් ටෙලි නාට්‍ය හා චිත්‍රපට නැරඹුවත් වේදිනා නාට්‍යයක් නැරඹීමෙන් ලැබෙන අපූර්වත්වය ප්‍රේක්ෂකයන් දන්නවා.

*මේ නාට්‍යය ඔබේ නිෂ්පාදනයක්'. එහෙම නේද?*

ඔව්. මෙය පරිවර්තනය කර අධ්‍යක්ෂණය කළේ බන්දුල විතානගේ මහතායි. මම මෙම නාට්‍යය නිෂ්පාදනය කළා. නව නිෂ්පාදනයක් හැටියට. මෙය මෙයට වසර කීපයකට පෙර නිෂ්පාදනය වූ නාට්‍යයක්. ඒ වතාවේත් ගම් නියම් ගම් දක්වා ඉතා සාර්ථකව මේ නාට්‍යය ප්‍රදර්ශනය කළා. එසේ වුවත් නව නිෂ්පාදනයද නැවත වාරයක් එම ගම් නියම් ගම් වගේම නගර වලත් සාර්ථකව රඟ දැක්වෙනවා. එයින් පේනවා මේ නාට්‍යයේ තිබෙන සාර්ථකත්වය.

*මොකක්ද මෙයට විශේෂ හේතුව?*

ඒ තමයි යම් යම් කර්තව්‍යයන්ගෙන් වෙහෙස වී සිටින ප්‍රේක්ෂකයන්ට මේ ප්‍රහසනය නැරඹීමෙන් ඔවුන්ගේ විඩාව දුරු කර ගන්නට ඉඩ ලැබීම. මේ නාට්‍යය ප්‍රහසනයක් වුවත් අවර ගණයේ විහිලු තහලු අඩංගු නාට්‍යයක් නෙවෙයි. දෙපිට කැපෙන වචන වලින් පිරුණ නාට්‍යයකුත් නෙවෙයි. එදිනෙදා ජීවිතයේදී අපට මුහුණ දෙන්නට වෙන ගැටලු විශේෂයෙන්ම පවුල් ජීවිතයේදී මුමුණ දෙන්නට වන ගැටළු දෙස හාස්‍ය ජනක බැල්මක් තමයි මේ නාට්‍යයේ තියේනනෙ.

මේ නාට්‍යයේ මා සමග ප්‍රවීණ රංගන ශිල්පීන් වන බන්දුල විතානගේ ජනක කුඹුකගේ වසන්ත විට්ටච්චි කුසුම් රේණු වජිරා කුමාරි හා සුජීව ප්‍රියලාල් රඟපානවා. මෙහි සංගීතය නවරත්න ගමගේ ගෙන්.

*රෝමය ගිණි ගනී ඔස්ට්‍රේලායා සංචාරය සංවිධානය වෙන්නෙ කොහොමද?*

මේ නාට්‍යයේ මේ ඔස්ට්‍රේලියා සංචාරය සංවිධානය කරන්නේ ඔබ කවුරුත් දන්නා ලක්මැදුර පදනම යි. මෙහි තවත් විශේෂත්වයක් තියෙනවා. මෙම නාට්‍ය නැරඹීමට ඔබ ප්‍රවේශපත්‍රයක් මිලට ගන්නා විට නොදැනුවත්වම තවත් වටිනා කාර්යයකට

*රෝමය ගිණී ගනී කියන අති විශිෂ්ට හාස්‍යෝත්පාදක නාට්‍යය නැරඹීමට මේ ලැබී තිබෙන අවස්ථාව මගහැරගන්න එපා කියන්න කැමතියි. මම ආරාධනා කර සිටිනවා මාර්තු 1 වෙනිදා සවස 5 ට බීසන් සෙන්ටර් රඟහලට පැමිණ රෝමය ගිණී ගනී බලන්න කියලා. අපි කැමතියි එදාට ඔබ මුණ ගැහිලා ඔබ සමග කතා බහ කරන්නට. මොහොතක් ගත කරන්නට. ඔබේ හිතේ තියෙන කරදර සියල්ල නිමා කොට අපූරුවට සිනා සී නිවසට යන්නට අවස්ථාවක් ඔබට ලැබෙන බව මට විශ්වාසයි.*

දායක වෙනවා. ඒ තමයි ශ්‍රී ලාංකියන් වෙනුවෙන් ප්‍රජා නිවහනක් ගොඩ නැගීමට ලක් මැදුර පදනම දරන උත්සාහයට දායක වීම. මේ සත් කාර්යයට යම් දායකත්වයක් සපයන්න ඉඩ ලැබීම ගැන අපිත් සතුටු වෙනවා.

*මේ කාලයේ අපේ ප්‍රවීණයන් ටෙලි නාට්‍ය හා චිත්‍රපට පසු පස දැව යන හැටි අපට පේනවා. ඒත් ඔබ පමණක් තවමත් නාට්‍ය ක්ෂෙත්‍රය තුළ රැඳී සිටිනවා. ඒ ඇයි කියලා කියන්න පුලුවන් ද?*

නෑ සියලුම ප්‍රවීණයන් නෙවෙයි. සමහර අය. නමුත් කියන්න සතුටුයි ජයලත් මනෝරත්න ආර් ආර් සමරකෝන් බන්දුල විතානගේ රෝහණ බැද්දගේ වගේ ප්‍රවීණයන් තවමත් අලුත් නාට්‍ය නිෂ්පාදනය කරනවා. මම කවදාවත් වේදිකාව අත අරින්නේ නැහැ. මම මගේ ගමන ආරම්භ කළේ වේදිකාවෙන්. මම ප්‍රේක්ෂකයන් අතරට ආවේ වේදිකාවෙන්. වෙනෙකක් තියා මගේ විවාහය සිදුවුණොත් වේදිකාවෙන්. ඉතින් වේදිකාව තමයි අපේ ජීවිතය.

*මෙය අමතරව ඔබ මේ දින වල සුභ සහ යස නාට්‍යයත් නිෂ්පාදනය කරනවා නේද?*

සයිමන් නවගත්තේගම ශූරීන්ගේ අපූරු නාටයක් වන සුබ සහ යස නාට්‍යය මම නිෂ්පාදනය කර මේ දින වල වේදිකා ගත කරනවා. මේ නාට්‍යයත් අපූරු දේශපාලන ප්‍රහසනයක්. නරඹපු අය දන්නවා ඇති සුභ සහ යස කියන්නේ සජීව කාලීන නාට්‍යයක්.

අපි බලාපොරොත්තු වෙනවා අනාගතයේදී සුභ සහ යස නාට්‍යයත් ඔස්ට්‍රේලියාවේ ප්‍රෙක්ෂකයන් හමුවට ගෙනෙන්න.

*ඔබ විදේශ සංචාර වලට යන විට ඒ රටවල ජීවත් වන ශ්‍රී ලාංකිකයන් නාට්‍ය නිෂ්පාදනය කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන බවක් පෙනී ගියා ද?*

ඔව්. නමුත් ඕස්ට්‍රේලියාව මෙයින් විශේෂත්වයක් ගන්නවා. හුගාක් ප්‍රවීණ ශිල්පීන් ඔස්ට්‍රේලියාවේ දැන් පදිංචි වී සිටිනවා. ඔවුන් විවිධ නාට්‍ය විවිධ කලා කටයුතු කරන බව අපට පෙනෙනවා. ඒ අතින් අනිත් සියලුම රටවලට වඩා ඔස්ට්‍රේලියාවේ සිටින කලාකරුවන් ඉදිරියෙන් සිටින බවයි අපේ නිරීක්ෂණය.

*ඔබේ ඉදිරි නිර්මාණ පිලිබඳව කතා කරමුද?*

මගේ ඉදිරි නිර්මාණය මම මේ දිනවල සැළසුම් කරගෙන යනවා. මෙහිදීත් යම් විශේෂ දෙයක් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. අපේ දේශීය සංගීතය සහ දේශීය නැටුම් කලාව කැටි කොටගත් නවමු නිර්මාණයක් ඉදිරියේදී ඔබට දැකගැනීමට හැකිවෙයි. එය මගේ සුවිශේෂී නිර්මාණයක් වේවි. මෙහි පිටපත මගේ සොහොයුරු අජිත් මෙන්ඩිස් විසින් රචනා කරනු ලබනවා.

**ශ්‍රීනාත් මද්දුමගේ**

*ඔස්ට්‍රේලියාවේ ප්‍රේක්ෂකයනට ඔබේ පණිවිඩය මොකක්ද?*

රෝමය ගිණී ගනී කියන අති විශිෂ්ට හාස්‍යෝත්පාදක නාට්‍යය නැරඹීමට මේ ලැබී තිබෙන අවස්ථාව මගහැරගන්න එපා කියන්න කැමතියි. මම ආරාධනා කර සිටිනවා මාර්තු 1 වෙනිදා සවස 5 ට බීසන් සෙන්ටර් රඟහලට පැමිණ රෝමය ගිණී ගනී බලන්න කියලා. අපි කැමතියි එදාට ඔබ මුණ ගැහිලා ඔබ සමග කතා බහ කරන්නට. මොහොතක් ගත කරන්නට. ඔබේ හිතේ තියෙන කරදර සියල්ල නිමා කොට අපූරුවට සිනා සී නිවසට යන්නට අවස්ථාවක් ඔබට ලැබෙන බව මට විශ්වාසයි. අප සමග මේ සංවාදයේ යෙදීම පිලිබඳව ශ්‍රියන්ත මෙන්ඩිස් මහතාට සන්නස පුවතපතේ ස්තුතිය හිමි වෙනවා. ලක්මැදුර පදනම ඉතා කැපවීමකින් කරගෙන යනු ලබන ශ්‍රී ලංකේය ප්‍රජා නිවහන ඉදි කිරීමේ කාර්යය වෙනුවෙන් ප්‍රදර්ශනය කෙරෙන රෝමය ගිණි ගනී නාට්‍යය නැරඹීමට මාර්තු 1 වන දිනය වෙන්කර තබා ගන්නට අමතක නොකරන්නැයි අපි ඉල්ලා සිටිනවා.

